# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - බදුල්ල

## සමාජ විද්‍යා තරගාවලිය (කලාප මට්ටම) - 2023

**12/13 ශ්‍රේණිය** **කාලය : පැය 02.30 යි.**

ශිෂ්‍යය/ශිෂ්‍යාවගේ නම ..........................................................................

පාසලේ නම ..........................................................................

පාසල් කාණ්ඩය ..........................................................................

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

1. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ ස්ථිර සාමාජිකයකු නොවන්නේ පහත දැක්වෙන කවර රට ද?
   1. චීනය 2. එක්සත් රාජධානිය 3. ඉන්දියාව 4. රුසියාව 5. ඇමෙරිකා එක්සත් ජනපදය

2. රාජ්‍යයක උත්තරීතර නීතිය ලෙස සැලකෙන්නේ,
   1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 2. ආගම 3. විශාරද මත 4. අධිකරණ තීන්දුව 5. සිරිත් විරිත්

3. GSP+ යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
   1. ආනයන බද්දකි. 2. බදු සහනයකි. 3. භාණ්ඩ ප්‍රවාහන ගාස්තුවකි.
   4. රසායනික පොහොර වර්ගයකි. 5. හරිතාගාර වායුවකි.

4. පවුලෙන් ලැබුණු සමාජ සුරක්ෂිතතාවය නිසා ශ්‍රේෂ්ඨ නිර්මාණකරුවෙකු බවට පත් වූ පුද්ගලයෙකු වන්නේ,
   1. ලෙනින් 2. මහත්මා ගාන්ධි 3. ජෝර්ජ් වොෂිංටන්
   4. ඒබ්‍රහම් ලින්කන් 5. තෝමස් අල්වා එඩිසන්

5. 2019 වර්ෂයේදී ශ්‍රී ලංකාව සංචාරක කටයුතු සඳහා ලෝකයේ අංක එකේ රට වශයෙන් ශ්‍රේණිගත කරන ලද ලෝක ප්‍රසිද්ධ සඟරාව කුමක් ද?
   1. ඩිස්කවරි (Discovery) 2. ටයිම් (Time) 3. නැෂනල් ජියෝ ග්‍රැපික් (National Geographic)
   4. ලෝන්ලි ප්ලැනට් (Lonely Planet) 5. ද ඉකොනොමික්ස්ට් (The Economist)

(ලකුණු 1 x 5 =05)

**ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඉරක් අඳින්න.**

6. පංච මහා වාද වලට අයත් වාද පමණක් දැක්වෙන පිළිතුරු කාණ්ඩය වන්නේ,
   A. වරාගොඩ වාදය B. පානදුරා වාදය C. උඳුන්ගොඩ වාදය
   D. ගම්පොළ වාදය E. බද්දේගම වාදය
   1. A B D හා E ය. 2. A B C හා D ය. 3. A E C හා D ය 4. A D E හා C ය. 5. B C E හා D ය.

07. ලෝකයේ භූමිකම්පා ඇතිවන ප්‍රධාන කලාප පමණක් ඇතුළත් පිළිතුරු කාණ්ඩය වන්නේ,

A. පැසිපික් සාගරය වටා විහිදී ඇති පැසිපික් කලාපය.

B. මධ්‍යධරණී හිමාලයා කඳු කලාපය.

C. මධ්‍ය අත්ලාන්තික් සාගරික වැටි කලාපය.

D. අප්‍රිකානු සාගරික වැටි කලාපය.

E. නැගෙනහිර පැසිපික් සාගරික වැටි කලාපය.

1. A B C හා D ය. 2. A B C හා E ය. 3. A B D හා E ය. 4. B E D හා A ය. 5. E D C හා B ය.

08. සාර්ක් සංවිධානයට අයත් රටවල් පමණක් අයත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

A. නේපාලය B. බුරුමය C. බංග්ලාදේශය D. ඉන්දියාව E. භූතානය

1. A C D හා E ය. 2. A C D හා B ය. 3. A B C හා D ය. 4. A B D හා C ය. 5. A B D හා E ය.

09. ෆැසිස්ට්වාදී චින්තනයේ සහ දේශපාලනයේ ප්‍රධාන ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

A. දේශපාලන ඒකබලවාදය B. රණකාමිත්වය C. රාජ්‍ය වන්දනය

D. අත්‍යයන්ත වර්ගවාදය හා උග්‍ර ජාතිවාදය E. පෞද්ගලික නිදහස

1. A C D හා E ය. 2. . B C D හා E ය. 3. A B C හා E ය. 4. A B D හා E ය. 5. A B C හා D ය.

10. පළමුවන ලෝක මහා සංග්‍රාමයෙන් පසුව වර්සෙල්ස් සාම ගිවිසුම ඇති කර ගැනීම සඳහා ප්‍රංශයේ පැරිස් නුවරදී පවත්වන ලද සාකච්ඡා වලට සම්බන්ධ රටවල් හා අදාළ නියෝජිතයින් අඩංගු පිළිතුරු කාණ්ඩය වන්නේ,

| | | |
|---|---|---|
| A. ඇමෙරිකා එක්සත් ජනපදය | - | වුඩ්රෝ විල්සන් |
| B. බ්‍රිතාන්‍ය | - | ලොයිඩ් ජෝර්ජ් |
| C. ප්‍රංශය | - | ක්ලෙමෙන්සෝ |
| D. ඉතාලිය | - | ඕලැන්ඩෝ |
| E. රුසියාව | - | ස්ටාලින් |

1. A B C හා D ය. 2. A B D හා E ය. 3. A C D හා E ය. 4. B C D හා E ය. 5. A B C හා E ය.

(ලකුණු 2 x 5 = 10)

**ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා නිවැරදි පිළිතුර යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.**

11. ලෝකයේ පියස්ස යන අන්වර්ථ නාමයෙන් හඳුන්වන ලොව උසම සානුව ............................ ය.

12. පරිගණකයේ දත්ත තැන්පත් කිරීමට භාවිතා කෙරෙන කුඩාම ඒකකය ............................ ලෙස හැඳින්වේ.

13. ලෝකයේ සිදුවන මරණ වලින් වැඩිම මරණ සංඛ්‍යාවකට හේතු වනුයේ ............................ ය.

14. කව්සිළුමිණ කෘතිය ............................ විසින් රචනා කර ඇත.

15. ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව ............................ ක්‍රීඩාව වේ.

(ලකුණු 2 x 5 = 10)

**ප්‍රශ්න අංක 16 සිට 25 දක්වා වූ ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

16. ලෝ ප්‍රකට රුසියන් නවකතාවක් වන "අම්මා" නවකතාවේ කතුවරයා ............................ය

17. ශ්‍රී ලංකාවේ ප්‍රථම පර්යේෂණ චන්ද්‍රිකාව ............................ යි.



CS CamScanner

18. ලොව පැරණිතම මෙන්ම දිගම දුම්රිය මාර්ගය ........................................................................ යි.

19. ලොව ප්‍රීතිමත්ම මිනිසුන් සිටින රට ........................................................................ යි.

20. 2018 පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙල පවත්වනු ලැබුවේ ........................................................................ ය.

21. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඇති පැරණිතම වංශ කතාව ........................................................................ යි.

22. මහාබාධක කොරල්පරය පිහිටා ඇත්තේ ........................................................................ ය.

23. එන්නත් කිරීම මගින් වලකාගත නොහැකි රෝගය වන්නේ ........................................................................ ය.

24. "කාලය පිළිබඳ කෙටි ඉතිහාසයක්" යන විද්‍යා පොත ලියුවේ ........................................................................ යි.

25. 2016 වර්ෂයේ දී ග්‍රීෂ්ම ඔලිම්පික් ක්‍රීඩා තරග පැවැත්වූ රට ........................................................................ යි.

(ලකුණු 2 x 10 = 20)

**ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා A B C D හා E යන පින්තූර ඇසුරෙන් පිළිතුරු සපයන්න.**


A


B


C


D


E

26. I. A රූපයෙන් දැක්වෙන පිංතූරය හඳුනාගෙන නම් කරන්න. ........................................

II. මෙම ව්‍යාපෘතිය නිම කිරීම සඳහා මූල්‍යාධාර ලබා දුන් රට සඳහන් කරන්න. ........................

27. I. B රූපයෙන් දැක්වෙන පිංතූරය හඳුනාගෙන නම් කරන්න. ........................................

II. ලොව හදවත ලෙස හඳුන්වන මෙම වනාන්තරය පිහිටියේ........................මහද්වීපයේය.

28. I. C රූපය හඳුනාගෙන නම් කරන්න. ........................................................................

II. මෙය පිහිටා ඇත්තේ කුමන රටේ ද? ........................................................................

29. I. D රූපය හඳුනාගෙන නම් කරන්න. ........................................................................

II. මෙම විශ්මිත නිර්මාණය කරවූ රජතුමා නම් කරන්න. ........................................



CamScanner

30. I. E රූපය හඳුනාගෙන නම් කරන්න. ..........................................................

II. දහස් ගනනක් මිනිසුන්ගේ මළ සිරුරු මතින් ඉදිවූ මෙම සුවිසල් නිර්මාණය අයත් රට කුමක් ද? ..........................................................

(ලකුණු 2 x 5 = 10)

**ප්‍රශ්න අංක 31 – 35 දක්වා ප්‍රශ්න වලට "අ" තීරුව හා "ආ" තීරුව යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවායේ සම්බන්ධතාවය අනුව ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

31. කාර්මික විප්ලවයේ නව සොයා ගැනීම් **"අ"** තීරුවේ ද ඒවා සොයාගත් පුද්ගලයන් **"ආ"** තීරුවේ ද දැක්වේ. **"අ"** සහ **"ආ"** ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| "අ" | "ආ" |
|---|---|
| I වාෂ්ප එන්ජිම | A. ඩෙම්ලර් |
| II. රූපවාහිනිය | B. ගැලීලියෝ ගැලිලි |
| I. මෝටර් රථය | C. ජේම්ස් වොට් |
| IV. මැකඩම් ක්‍රමය | D ජෝන් මැකඩම් |
| V. දුරදක්නය | E. ජෝන් ලොගී බෙයාඩ් |

1. D A B C E   2. C E A D B   3. C D A B E   4. A C E D B   5. D C A B C

32. **"අ"** තීරුවේ දැක්වෙන යන්ත්‍රය හා සම්බන්ධ ක්ෂේත්‍රය **"ආ"** තීරුවෙන් ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| I. ATM | A. කෘෂිකර්මය |
| II. ECG | B. ආරක්ෂාව |
| III. RFID | C. සෞඛ්‍ය |
| IV. CCTV | D. අධ්‍යාපනය |
| V. MULTIMEDIA PROJECTOR | E. බැංකු කටයුතු |

1. A C B D E   2. A B D C E   3. B C A E D   4. D A B E C   5. E C A B D

33. **"අ"** තීරුවේ වැඩිවීම **"ආ"** තීරුවේ වැඩිවීමට බලපෑම් ඇතිකරන ආකාරය ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| I. පොසිල ඉන්ධන භාවිතය | A. ඵලදායීතාවය |
| II. යැපෙන්නන් | B. ක්‍රය ශක්තිය |
| III. කාර්යක්ෂමතාවය | C. සේවා නියුක්තිය |
| IV. ආදායම | D. කුටුම්භ වියදම |
| V. තාක්ෂණික දියුණුව | E. ගෝලීය උණුසුම |

1. E D A B C   2. A C B D E   3. B C A E D   4. C D B A E   5. E A B C D



CS CamScanner

34. "අ" තීරුවේ වැඩිවීම "ආ" තීරුවේ අඩුවීමට බලපෑම් ඇති කරන ආකාරය ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| I. සාක්ෂරතාවය | A. වන ගහනය |
| II. විකල්ප බලශක්ති භාවිතය | B. දරිද්‍රතාවය |
| III. සංවර්ධනය | C. නූගත්කම |
| IV. සේවා නියුක්තිය | D. පරිසර දූෂණය |
| V. නිෂ්පාදනය | E. මිල |

1. A D B C E  2. A B C E D  3. B E C D A  4. C D A B E  5. C A B E D

35. "අ" තීරුවේ දැක්වෙන කෘතීන් රචනා කළ කතුවරුන් "ආ" තීරුවේ දැක්වේ. එය නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| "අ" | "ආ" |
|---|---|
| I. කෝකිල සංදේශය | A. අලගියවන්න මුකවැටිතුමා |
| II. සැළලිහිණි සංදේශය | B. ඉරුගල් කුලතිලක හිමි |
| III. ගුත්තිල කාව්‍ය | C. වීදාගම මෛත්‍රීය හිමි |
| IV. ලෝවැඩ සඟරාව | D. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි |
| V. සුභාෂිතය | E. වෑත්තෑවේ හිමි |

1. B D E C A  2. B A D E C  3. B D E C A  4. B D C E A  5. B A E D C

(ලකුණු 2 x 5 = 10)

**ප්‍රශ්න අංක 36 - 40 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සපයන්න.**

36. I. ශ්‍රී ලංකාවේ ප්‍රථම නාමික විධායක ජනාධිපතිවරයා නම් කරන්න.

..................................................... (ලකුණු 01)

II. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ දෙකක් ලියන්න.

1. .....................................................

2. ..................................................... (ලකුණු 02)

III. විධායක ජනාධිපතිවරයෙකු සතු අධිකරණ බලය කෙටියෙන් පැහැදිලි කරන්න.

.....................................................

.....................................................

.....................................................

(ලකුණු 02)

37. I. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට හේතුවන ප්‍රධාන වායු වර්ගය නම් කරන්න.

..................................................... (ලකුණු 01)

II. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට බලපාන.

* මානුෂ සාධකයක් .....................................................
* ස්වභාවික සාධකයක් ..................................................... (ලකුණු 02)

III. දේශගුණික වෙනස්වීම් මානව කටයුතු වලට ඇති කරන අහිතකර බලපෑමක් කෙටියෙන් විස්තර කරන්න. .....................................................

.....................................................

.....................................................

.....................................................

(ලකුණු 02)



CamScanner

38. I. සතුරු බලය පරදා ප්‍රථම වරට ලක්දිව එක්සේසත් කළ රජතුමා කවුද?

..................................................................... (ලකුණු 01)

II. එතුමාගෙන් සිදු වූ

* ආර්ථික සේවාවක් ....................................................................................................
* ආගමික සේවාවක් ....................................................................................................

(ලකුණු 02)

III. කෝට්ටේ යුගයේ සාහිත්‍ය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

(ලකුණු 02)

39. I. නිරිත දිග හා ඊශාන දිග සුළං ධාරා මඟින් ලැබෙන වර්ෂාපතනය නම් කරන්න.

..................................................................... (ලකුණු 01)

II. ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ප්‍රධාන ක්‍රම දෙකක් ලියන්න.

1. ........................................ 2. ........................................ (ලකුණු 02)

III. අධික වර්ෂාව නිසා සිදුවන ආපදා තත්ත්වයන් අවම කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න.

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

(ලකුණු 02)

40. I. GPS තාක්ෂණයට චන්ද්‍රිකා තොරතුරු ලබා ගැනීම හා මෙහෙයවීම සඳහා ඇති ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය පිහිටි රට කුමක් ද? ........................................

(ලකුණු 01)

II. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය අනිසි ලෙස භාවිතයේ දී නූතන සමාජය මුහුණපාන ගැටළු දෙකක් ලියන්න.

1. ....................................................................................................................

2. ....................................................................................................................

(ලකුණු 02)

III. සමාජ ජාලා වෙබ් අඩවි භාවිතයෙන් ඇතිවන අපරාධ අවම කර ගැනීමට ඔබ කරන යෝජනාවක් කෙටියෙන් විස්තර කරන්න.

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

(ලකුණු 02)

ප්‍රශ්න අංක 41 - 45 දක්වා ඇති වගන්ති ඇසුරෙන් ස්ථාන හඳුනාගෙන සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

41. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ වරාය පිහිටි නගරය.
42. ධාතුසේන රජතුමා විසින් කලා ඔය හරස් කර නිර්මාණය කර ඇති වැව.
43. දළදා වහන්සේ රැගෙන හේමමාලා හා දන්ත කුමරු ගොඩ බට වරාය.
44. ශ්‍රී ලංකාවේ අඩුම ජනගහනය සිටින දිස්ත්‍රික්කය.
45. කොඩ්ඩියාර් බොක්කට ගලා බසින ගංගාව.

(ලකුණු 1 x 5 = 05)




CamScanner

**ප්‍රශ්න අංක 46 - 50 දක්වා ඇති වගන්ති ඇසුරෙන් ස්ථාන හඳුනාගෙන සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි ලකුණු කර නම් කරන්න.**

46. ආසියාවේ කොඳුනාරටිය ලෙස හැඳින්වෙන කඳුවැටිය.
47. වස්කෝද්ගාමා පෙරදිගට පැමිණ ගොඩබට වරාය.
48. මධ්‍යධරණී මුහුද හා රතු මුහුද යා කරන ඇළ.
49. මහද්වීප හතරකට මැදිවූ සාගරය.
50. අභ්‍යන්තර දේශපාලනික අර්බුධයක් සමථයකට පත් කිරීම සඳහා වර්ෂ 2010 දී ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාට ආරාධනා කළ රට.

(ලකුණු 1 x 5 = 05)





LOL.lk
**BookStore**

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**